)වීඥ්ඩ් ඥදවීලු!දි ටීඍිරිමීවී
*All Rights Reserved*

# අවසාන වාර පරීක්ෂණය 2015

**5 ශ්‍රේණිය** — **සිංහල** — **කාලය පැය 1 යි. වි. 30 යි.**

නම/ විභාග අංකය:

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01 පහත වූ ඡේදය කියවා අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ඔවුන් හිමිදිරියේ වන රොදට ඇතුළු වූයේ ලබුකැටවලට පුරවා ගත් ජලය හා කුරහන් තලප, තැම්බූ අල වර්ගයක් හෝ වෙනත් සප්පායමට ගත හැකි අඩුම කුඩුමද රැගෙනය. ගෙන ආ කැති, මන්නා, පොරෝ වේගයෙන් ඒ මේ අත වැදෙන්නට විය. ගෙන ආ කිසිම මෙවලමක් නිකරුණේ බලා නොසිට කාගේ හෝ අතක වැඩක යෙදී සිටියි. කඩිගුලක් ඇවිස්සුණු ස්වරූපයෙන් වනරොද තුළ ඔවුන් යුහුසුළුව වැඩෙහි යෙදෙමින් පැමිණි කාරණය ඉටුකර ගැනීමට වෙහෙස විය. ටික වේලාවකින් ආවරණය වී තිබූ පස ගොවි බිමකට අවශ්‍ය හිරු එළිය මනාව ලැබෙන පරිදි සැකසී, කැපී ගිය ලඳු කැලෑව පිළිස්සීමෙන් නැගෙන දුම්රොඩු අවට සිසාරා විහිදේ. එසේ පස පිළිස්සීමෙන් ඉදිරියේ සිටවීමට බලාපොරොත්තු වන කුරහන්, තල, මෙනේරි, අබ, මුං, බඩඉරිඟු, කව්පි වැනි බෝග රෝග වැළඳීමෙන් තොරව වැඩීමට පස පිරිසිදු වන බව ඔවුහු විශ්වාස කරති.

The National e-learning Portal for The General Education

(1) ඡේදයෙන් විස්තර වන්නේ කුමන ගොවිතැනක් ගැනද?

.................................................................................................

(2) ජලය ගෙන ගියේ කුමකින් ද? ..........................................

(3) උදේ හා දහවල් ආහාර සඳහා ගෙන ගියේ මොනවා ද?

.................................................................................................

(4) කඩිසරව වැඩ කිරීමට යොදාගත් උපකරණ 2 ක් ලියන්න.

1. ........................................ 2. ........................................

(5) වගා කිරීමට බලාපොරොත්තු වන බෝග වර්ග 2 ක් ලියන්න.

1. ........................................ 2. ........................................

(6) ඡේදයේ ඇති යුගල පදයක් ලියන්න.

.................................................................................................

(7) ලඳු කැලෑ ගිනි තැබීමෙන් ඔවුන් බලාපොරොත්තු වූයේ කුමක් ද?

.......................................................................................................................................

(8) සමාන පද ලියන්න.

1. ජලය .............................................. 2. හිරු ..............................................

(9) විරුද්ධ පද ලියන්න.

1. අවශ්‍ය .............................................. 2. එළිය ..............................................

(10) ඔවුන් යුහුසුළුව වැඩ කිරීම සම්බන්ධයෙන් දක්වන උපමාව ලියන්න. ..............................................

02 උත්තර ලියන්න. (2 x 10 = 20)

(1) වචන ගළපා වැකි සාදන්න.

1. පිරිසිදුව / තබා / පරිසරය / අප / ගැනීමට / යුතුය / වෙහෙසිය

.......................................................................................................................................

.......................................................................................................................................

2. අහස් / සරසන / වලා / ගැබ / පෙළ / ලෙස / මනා / ලදී

.......................................................................................................................................

.......................................................................................................................................

(2) තනි පද ලියන්න.

1. වැස්ස ස්වභාවයෙන්ම නැති කාලය ..............................................

2. පොත් කියවන්නා ..............................................

(3) හිස්තැනට සුදුසු පද යොදන්න.

1. .............................................................. දිය නෑමට ගඟට ගියෙහු.

2. කොක් පෙළ අහසේ පියාසර ..............................................................

(4) ගැළපෙන අතීතකාල ක්‍රියාපද යොදන්න.

1. වැස්සට පෙර අහසේ අඳුරක් ..............................................

2. අපි පාසල් මිදුලේ මල් පාත්ති සකස් ..............................................

(5) සුදුසු විරාම ලක්ෂණ යොදන්න.

1. අනේ මාවත් ගන්න ඔයගොල්ලන්ගේ සෙල්ලමට

2. ඔයාගේ නම මොකක් ද

(6) ප්‍රස්ථා පිරුළු සම්පූර්ණ කරන්න.

1. ගහෙන් වැටුණු මිනිහට ........................................

2. කොහොඹ ගහට ........................................ ගියා වගේ

(7) පද පෙරළිය සකස් කරන්න.

1. කළුබඩම්ල ........................................

2. ල්ච්පොවාකි ........................................

(8) පහත සඳහන් පද්‍යයන් රචනා කළ කතෘවරුන්ගේ නම් ලියන්න.

1. පින්බර ලක් මව ........................................

2. අලුත් පාර මට හීනෙන් පෙනේ ........................................

(9) තේරවිලි විසඳන්න.

1. බෙල්ලෙන් අල්ලලා මුල්ලෙන් තියනවා ........................................

2. කටු නැති කැලේ ඇට නැති සතා ........................................

(10) නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න.

1. කොළඹ වරායේ (නැවු / නැව්) රාශියක් නවතා තිබුණි.

2. අපි (පස්පවු / පස්පව්) වලින් වළකිමු. (2 x 10 = 20)

03 නිවැරදි වචනය යටින් ඉරක් අඳින්න

(1) සරීර ශක්තිය / ශරීර ශක්තිය / ශරීර සක්තිය

(2) සාකච්චාව / සාකච්ඡාව / සාබච්ඡාව

(3) වලාකුලු / වළාකුළු / වලාකුළු

(4) කණ්ඩායම / කන්ඩායම / කංඩායම

(5) දේසාභිමානය / දේෂාභිමානය / දේශාභිමානය

(2 x 5 = 10)

04 හිස්තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා ලියන්න.

(වියන / පමණ / ගියේ ය / අයියා / බැලුවේ / රැළි / විදේශීය / අලි ඇතුන් / පසෙක / සිසාරා)

දිනක් මම ....................... සමග මහනුවර දළදා පෙරහැර බැලීමට ....................... අප එහි ළඟා වන විට හවස හතරට ....................... ඇත. දළදා මාලිගාව ඉදිරිපිට වැව අසල ගස් සෙවණේ අපි වාඩි වුනෙමු. වැව ....................... හැමූ සිහින් වා .......................අප ගතෙහි දැවටුණේ අපේ ගමන් වෙහෙස නිවාලමිනි. දළදා මාලිගාවේ රන් ....................... අප සිටි තැනට මැනවින් පෙනුණි. එක් ....................... ඉදිකර තිබුණු අට්ටාල පෙරහැර නැරඹීමට එන ....................... සංචාරකයන් සඳහා වෙන්කර තිබූ අතර සාමාන්‍ය ජනතාව පෙරහැර ....................... මහමග දෙපස සිටය. ....................... විශාල ප්‍රමාණයක් සන්සුන් ගමනින් පෙරහැරේ ගමන් කළහ. (2 x 10 = 20)

05 කෙටි උත්තර ලියන්න.

(1) ලෝකයේ ප්‍රථම මුද්දරය බිහිවූයේ කුමන රටේ ද?

.......................................................................................................

(2) සොරබොර වැව සෑදුවේ කවුද?

.......................................................................................................

(3) වීදුරු සෑදීමට ගන්නා මූලද්‍රව්‍යයක් ලියන්න.

.......................................................................................................

(4) පැල් රැකීමේ යෙදී සිටින ගොවියා කියන කවි මොනවා ද?

.......................................................................................................

(5) දියවන්නා ඔය මත සාදාතිබෙන ගොඩනැගිල්ලේ නම ලියන්න.

.......................................................................................................

(2 x 5 = 10)

06 ''මා දුටු අලංකාර දියඇල්ල'' යන මාතෘකාව යටතේ වැකියක වචන 5/6 ක් ඇතුළුවනසේ උක්ත ආඛ්‍යාත සම්බන්ධ අර්ථවත් වැකි 5 ක් ලියන්න.

**මා දුටු අලංකාර දියඇල්ල**

(1) .......................................................................................................

(2) .......................................................................................................

(3) .......................................................................................................

(4) .......................................................................................................

(5) .......................................................................................................

(4 x 5 = 20)